visionaries in the creative force that linked the East and the West. Perhaps as I see it this may be the first ever attempt to introduce a work of Forster to the Sinhala reader.

I wish that the translation of Forster's work into Sinhala ought to fill a void. It was recurring from time to time. Finally it is necessary also to observe that critical works on narratology have changed over the years. In a future edition a better Sinhala preface as regards these developments is anticipated.

# 32

# කාලයෙහි ගලායෑම ගැන චින්තාවක්

*ශක්තික සත්කුමාර*

මහැදුරු කුලතිලක කුමාරසිංහගේ තෙවන කාව්‍ය සංග්‍රහය ලෙස "වරෙන්තුව" හඳුන්වා දිය හැකිය. මීට පෙර 'නැත ලොවේ අන් රසඳුනා' 'අසනිපාතය' නමින් කාව්‍ය සංග්‍රහ දෙකක් නිකුත් කර ඇති කුලතිලක කුමාරසිංහ ඔහුගේ නවතම කාව්‍ය සංග්‍රහයට පද්‍ය රචනා 48ක් ඇතුළත් කර ඇත. විශ්වවිද්‍යාල මහාචාර්යවරයෙක් වශයෙන් තමන් ගත කරන ජීවිතයේ දී ඔහු අත්දකින විවිධ සමාජ සංසිද්ධීන්, ප්‍රේමය, කාලයෙහි ගලා යෑම ආදී අත්දැකීම් ඔහු තම නිර්මාණ සඳහා වස්තු විෂය කරගෙන ඇති බව මෙම කවි රසවිඳින අපට පෙනී යන කරුණකි.

"වරෙන්තුව" කාව්‍ය සංග්‍රහයට පෙරවදනක් සපයන මහාචාර්ය විමල් දිසානායකයන් පවසා ඇත්තේ, කුලතිලක කුමාරසිංහ කවියාගේ බොහෝ නිර්මාණයන්ට පදනම් වී ඇති තේමාවන් අතරින් කාලය සහ එහි ප්‍රබලත්වය යන කාරණා ප්‍රමුඛස්ථානයක් ගෙන ඇති බවයි. කාලයෙහි ගලා යෑම පිළිබඳ දාර්ශනික චින්තාවන් මෙකී කවියා තම නිර්මාණවලට පාදක කරගත්ත ද එහි යම් අපූර්වත්වයක් පෙනෙන්නට ඇත. සාමාන්‍ය පුද්ගලයකුට නැතිනම් තරුණයකුට තම උපන් දිනය ප්‍රීතිය ගෙන දෙන දිනයක් වුවද කවියා එම උපන්දිනය දකින්නේ මරණ වරෙන්තුවක් ලෙසයි.

මට අවුරුදු පනස් අටයි
මරණයෙ දොරටුව අසලට
කෙමෙන් කෙමෙන්
බඩගාගෙන ළඟාවෙමින් සිටිනෙමි මම
උපන් දිනය හඬ ගා මට
මරණ වරෙන්තුවක් ලෙසින්
උදෑසනම කන් බෙරයට
හඬ ගා බෙරිහන් දුන්නේ (පිටුව 51)

ග්‍රන්ථ නාම පද්‍යය මගින්, උපන්දිනය උත්සවයක් ලෙස ගෙන විවිධවූත්, විෂම වූත් අනර්ථකාරී ක්‍රියාවන් කරන සමාජය දෙස වෙනත් ඇසකින් බැලීමට කවියා උත්සාහ දරා ඇති බව පෙනේ. කුලතිලක කුමාරසිංහ කවියාගේ "වරෙන්තුව" පද්‍ය නිර්මාණය කියවන විට අපගේ සිහියට නිතැතින්ම හැඟෙන්නේ උදේනි සරත්චන්ද්‍රයන්ගේ "පුරඟන නැඟණියෝ" කාව්‍ය සංග්‍රහයෙහි එන "කාල සර්පයා" නමැති පද්‍යයයි.

"වරෙන්තුව" කාව්‍ය නිර්මාණයේදී කාලයේ ගලායෑම එක් ඇසකින් දකින කවියා, "ජීවිතය" නමැති කාව්‍ය නිර්මාණයේ දී එය වෙනත් කෝණයකින් දැකීමට උත්සාහ කරයි. විවිධ වූ අපේක්ෂාවන් මුදුන්පත් කරගැනීමට වෙහෙසෙන වර්තමාන මිනිසා පිළිබඳව සහ අවසානයේදී අතෘප්තිකර ස්වභාවයෙන් පෙළෙන ඔවුන්ගේ දිවි පෙවෙත පිළිබඳව ගැඹුරු සමාජ යථාර්ථයක් මෙම නිර්මාණයට පාදක වී ඇත.

ජීවත්වීම පිළිතුරු සැපයිය නොහැකි
පැනපත ලෙස දැනේ අදවස සිතට දැඩි
පැනයෙන් පැනය පිළිතුරු සැපයුවද නිසි
නැත සැනසීම දැනෙනුයෙ හදවතට කිසි

යන මඟ නොදැන යන බව පමණක් දනිමි
නැත අත රැඳුණු කිසිවක් සුරැකී රැඳුණු
මා නැවතුණත් නැත නැවතෙනු මේ ගමන
රෝ දුක් මැදින් ගොන් ගැල ලෙස යයි පෙරට (පිටුව 49)

ජීවත් වීම යනුඃ ප්‍රශ්නවලට පිළිතුරු සෙවීම යන දාර්ශනික මතයෙහි පිහිටා තම නිර්මාණයෙහි සන්දර්භය සකස් කර ඇති කවියා පවසා සිටින්නේ, ජීවිතයේ එන සෑම ගැටලුවකටම පිළිතුරු සැපයුවත් එහි නිමාවක් නොදකින බවත්, ඒ තුළින් හදවතට සැනසීමක් ලබාගත නොහැකි බවත්ය. "යන මඟ නොදැන යන බව පමණක් දනිමි" යන පද්‍ය පාදය තුළ ජීවිතය යනු? සංසාරයේ තවත් එක් නැවතුමක් පමණක් බව ඉඟි කිරීමට කවියා උත්සාහ දරා ඇත. එය එක්තරා ආකාරයක විඥානවාදී අදහසකි. "රෝදුක් මැදින් ගොන් ගැල ලෙස යයි පෙරට" යන පද්‍යය තුළින් කවියා බුදුසමයට අනුව ජීවිතය කියවීමට උත්සාහ දරා ඇති බව පෙනේ. මේ කවියෙහි විශේෂත්වය වන්නේ ප්‍රබල දාර්ශනික අදහසක් සරල, සුගම බස් වහරකින් රිද්මයානුකූලව ගලා යෑමට සැලැස්වීමයි.

අපූර්ව පද සංඝටනාවකින් යුක්තව මේ ජීවිතයෙහි පවත්නා සැබෑ තත්ත්වයත්, වර්තමාන ව්‍යාජ සමාජය විසින් එකී සැබෑ තත්ත්වය වැසීමට දරන උත්සාහයත් උපහාසය දැනවෙන අයුරින් කවියා "සැඟවිය නොහැකිය" යන පද්‍ය නිර්මාණයෙන් ඉදිරිපත් කර ඇත්තේ මේ ආකාරයටයි.

ඩයිවලින් කිසිවකුට
සැඟවිය නොහැක
ජීවිතය
සෙන් පවුඩර්වලින්
වසන් කළ නොහැක
ජීවන සුවඳ



බොරු දත්වලින්
වැසිය නොහැකිය
ගෙවී යන ජීවිතය
ඇඳුමෙන් පැළඳුමෙන්
පාවහන් යුගලයෙන්
පෙන්විය නොහැක
නාඹර තරුණ විය (පිටුව 56)

කුලතිලක කුමාරසිංහ කවියා "වරෙන්තුව" කාව්‍ය සංග්‍රහයේදී කවියේ ආකෘතිය පිළිබඳව විවිධ වූ අත්හදාබැලීම් කරන්නට උත්සාහ දරා ඇති බව පෙනේ. "රංචාගොඩ ළමයාගේ කවි" යන පද්‍ය නිර්මාණයේදී පැරණි කවි ආකෘතිය නව්‍යත්වයකින් යුතුව භාවිතයට ගෙන ඇත. එය එක්තරා ආකාරයක සාර්ථක උත්සාහයක් ලෙස අගය කළ හැක.

කවියෙක් තමන් දන්නා හඳුනන තවත් කවියකු අමතා කවි ලිවීම, ඒවා තමන්ගේ කාව්‍ය ග්‍රන්ථවලට ඇතුළත් කිරීම, කොළඹ යුගයේ කවීන්ගේ පටන් එන සත් සිරිතකි. "වරෙන්තුව" කාව්‍ය සංග්‍රහයේදී ද කුලතිලක කුමාරසිංහ කවියා "විමල් දිසානායකට" සහ "පරාක්‍රම කොඩිතුවක්කුට" යනුවෙන් නිර්මාණ දෙකක් ඇතුළත් කර තිබුණද එකී කවිවල යම් වාර්තාරූපී ස්වභාවයක් පෙනෙන්නට තිබේ. කවියේ රසය මතුවීමට එම වාර්තාමය ස්වභාවය බාධාවක් වී ඇත. කුලතිලක කුමාරසිංහ කවියා මීට පෙර ප්‍රකාශයට පත් කළ කාව්‍ය සංග්‍රහ දෙකෙහි මෙන්ම "වරෙන්තුව" කාව්‍ය සංග්‍රහයේදීත් තමන් විදේශීය වශයෙන් ලැබූ අත්දැකීම් තම නිර්මාණවලට පාදක කරගෙන ඇත. තමන් උපන් බිමත්, විදේශීය රටවලුත් අතර සැරිසරන ඔහුගේ කවි සිත වඩාත් පෙම්බඳින්නේ තම මව් රටට බව එකී නිර්මාණ විමර්ශනය කිරීමේදී අපට පෙනී යන පරම සත්‍යයකි.